**ශීර්ෂය - 219 ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**

**------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) දේපල පිරියත හා උපකරණ** | | |
| සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ 2018 ජනවාරි 01 දිනට දේපල පිරියත හා උපකරණවල වටිනාකම රු.1,312,337,455 ක් වූ අතර එය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ රු.107,593,066 ක් වී තිබුණි. ඒ අනුව රු.1,204,744,389 ක වෙනසක් පැවතුණි. | වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. | 2017 වර්ෂයේ දේපල, පිරියත හා උපකරණවල වටිනාකම රු.1,312,337,455 ක් 2017 දෙසැම්බර් භාණ්ඩාගාර සටහන් පදනම් කරගෙන ඉදිරිපත් කර ඇත.<br>මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ 2018.01.01 දිනට දේපල, පිරියත හා උපකරණවල වටිනාකම වන රු.107,593,066 හි කෙරීගෙන යන වැඩවල ශේෂය වන රු.1,272,115,674 ඇතුළත් නොවන අතර ආරම්භක ශේෂ ඇතුළත් කිරීම සඳහා ස්ථානයක් නොමැති වීම ඊට හේතු විය. 2018 වර්ෂයේදී තක්සේරු කරන ලද වත්කම් වටිනාකම් භාණ්ඩාගාර සටහන් මගින් ආරම්භක |

ශේෂයට ඇතුළත් කර ඇති අතර එම තක්සේරු වටිනාකම වන රු.67,371,286 ඉහත රු.107,593,066 ක වටිනාකම තුළ ඇතුළත්ව ඇත.

## 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය**<br>විදුලි උපාංග සහ උපකරණ පිළිබඳව ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය පවත්වා ගෙන යන මෙන් අධ්‍යක්ෂ (ඉංජිනේරු) වෙත උපදෙස් ලබා දී ඇත. |

## 1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| **නීති, රීති රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**<br>XII වන පරිච්ඡේදයේ 2.1 වගන්තිය | රිඩ් මාවතේ නේවාසිකාගාරයේ නිවාස පාලිකාවට 2018 සැප්තැම්බර් 01 දින සිට 2019 අප්‍රේල් 01 දින | නිවාඩු අනුමත කිරීමේදී වෙනත් | ඉදිරියේදී මෙවැනි ගැටළු සිදු නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග |

| | | |
|---|---|---|
| දක්වා ප්‍රසූත නිවාඩු අනුමත කර තිබුණද, අදාළ රාජකාරි කටයුතු ආවරණය කර ගැනීමට විධිවිධාන යොදා ගෙන නොතිබුණි. | නිලධාරීන් ලවා රාජකාරි ඉටුකරවා ගැනීමට විධිවිධාන යොදා ගත යුතු වීම. | ගන්නා බව දන්ව සිටිමි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**
**--------------------**

**2.1** **අග්‍රිම කළමනාකරණය**
**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය**<br>**--------------------** | **නිර්දේශය**<br>**----------** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>**-------------------------------------** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව පිළියෙල කර තිබුණු අග්‍රිම ඇස්තමේන්තු අනුව අපේක්ෂා කළ හා ඉල්ලුම් කළ අග්‍රිමය රු. මිලියන 6,462.9 ක් වී තිබුණි. ඒ සඳහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 2,024 ක අග්‍රිම ලැබී තිබුණි. සැලැසුම් කළ පරිදි නියමිත කාල වකවානුවල අදාළ කාර්යයන් ඉටු නොකර එම කාර්යයන් වර්ෂය අවසානයේ යොදා ගැනීම හා අවශ්‍ය අග්‍රිම භාණ්ඩාගාරය විසින් ලබා නොදීම හේතුවෙන් රු.මිලියන 73 ක් වූ විට්ස්වයික් පාර්ක් පිහිනුම් තටාකය ඉදිකිරීමේ ව්‍යාපෘතිය, රු.මිලියන 21 ක් වූ 17 වන පටුමග ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතිය හා යටිතල පහසුකම් සංවර්ධනය වැනි කාර්යයන් ඉටුකිරීමට නොහැකි වී තිබුණි. | සැලසුම් කළ පරිදි අග්‍රිම ලබා ගෙන අදාළ කාර්යයන් නිම කළ යුතු වීම. | මුදල් ප්‍රතිපාදන නොලැබීම හා වෙනත් හේතුන් රාශියක් නිසා 2017 වර්ෂයේදී ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි විය. තවද ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරන බව දන්වා සිටියද ප්‍රතිපාදන නොලැබීම හා ඉදිකිරීම් මන්දගාමී තත්ත්වයකට පත් විය. |

**2.2 වියදම් කළමනාකරණය**

pahata sadahan

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **අයවැය විචලනය** | | |
| (අ) වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.මිලියනයක ප්‍රතිපාදනය කිසිඳු උපයෝජනයකින් තොරව මුළුමනින්ම ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අපේක්ෂා කර තිබූ වියදම් සිදු නොවීම හේතුවෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි විය. |
| (ආ) වැය විෂයයන් 25 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා, එම වැය විෂයයන්වල ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 95 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ව්‍යාපෘති පිළිබඳ තීරණ ගැනීම මන්දගාමී වීම ඉතිරියට හේතු වී තිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අවුරුදු 13-14 වයස් කාණ්ඩවල පසුවන ක්‍රීඩා කෞශල්‍යාන්ගෙන් හෙබි දරුවන් විද්‍යාත්මක පදනමකින් හඳුනා ගනිමින් 2024 සහ 2028 | සැලසුම් කළ කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ යම් යම් ගැටළුකාරී තත්ත්වයන් මත ව්‍යාපෘති |

| | | |
|---|---|---|
| වර්ෂවලදී පැවැත්වෙන ඔලිම්පික් තරඟාවලියට යොමු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා එකතුව රු. මිලියන 474 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එයට රු. මිලියන 132.1 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේදී නවතා තිබුණු අතර ව්‍යාපෘතියේ ප්‍රගතිය හා නවතා දැමීමට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අනෙකුත් සැලසුම් හා කාල රාමුව නිවැරදිව සැලැසුම් කළ යුතු වීම. | තාවකාලිකව නවතා දමන ලද අතර නැවත එම ව්‍යාපෘතිය නව වැඩපිළිවෙලක් යටතේ ආරම්භ කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමග සාකච්ඡා කරමින් පවතී. |

**3.2** **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| පළාත් සහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම යටතේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 12 ක් සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 7 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 1,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 10 ක් සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 07 ක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඒ සඳහා රු.මිලියන 692 ක් වැය කර තිබුණි. එයින් දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 6 ක් සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 2 ක වැඩ අවසන් කර තිබුණු අතර ඉතිරි දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 4 ක සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 5 ක වැඩ අවසන් කර නොතිබුණි. | සැලැසුම් කළ කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය කාල රාමුව නිවැරදිව සැලැසුම් කළ යුතු වීම. | මේ වන විට අනුරාධපුර, මාතර, පොළොන්නරුව,පුත්තලම,දීගන, බණ්ඩාරගම,කිලිනොච්චිය, කෑගල්ල,මඩකලපුව යන ක්‍රීඩා සංකීර්ණ ජනතා අයිතියට විවෘත කර ඇත. ගාල්ල,අම්පාර,රත්නපුර,මාතලේ ක්‍රීඩා සංකීර්ණ 2019 ජූනි අවසානයේදි ජනතා අයිතියට පැවරිමට නියමිතය. ඉතිරි ක්‍රීඩා සංකීර්ණ 2019 වර්ෂය අවසන් වීමට ප්‍රථම ජනතා අයිතියට පවරා දීමට යෝජිතය. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **වැටුප් පරිවර්තනයේදී වැඩිපුර ගෙවූ වැටුප් අයකර නොගැනීම.**<br>ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන් ඒකාබද්ධ සේවයේ ව්‍යාපෘති නිලධාරී තනතුරට උසස් කිරීමට අදාළව වැටුප් පරිවර්තන සිදු කිරීමේදී, වැටුප් වැඩියෙන් ගෙවා තිබුණි. දැනට සේවයේ නියුතු නිලධාරීන් 26 දෙනෙකුගෙන් රු.1,197,957 ක් ද විශ්‍රාම ලැබූ නිලධාරීන් 5 දෙනෙකුගෙන් රු.496,524 ක් ද 2018 දෙසැම්බර් 31 දිනවන විටත් අයකර ගෙන නොතිබුණි. තවද වයස අවුරුදු 55 සම්පූර්ණ කර නොතිබූ, එක් නිලධාරියෙකුට 2017 අප්‍රේල් 8 දින සිට විශ්‍රාම ගැනීම අනුමත කර තිබුණු අතර එම නිලධාරියා සඳහා වැඩිපුර ගෙවා තිබූ වැටුප් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 119(1) පරිදි කටයුතු කළ යුතුවීම. | අදාළ නිලධාරීන්ගෙන් මෙම මුදල් ආපසු අයකර ගනිමින් පවතී. |
| (ආ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.151,786 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 5 කට වැඩි කාල පරාසයක් ගත වී තිබුණද, අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු වීම. | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කර ගනිමින් පවතී. |

**3.4 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්** | | |
| | (i) දෙපාර්තමේන්තුවට අයත් කැබ් රථයක් වර්ෂයක කාලයක සිට නිෂ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවතුණි. | 1997 සැප්තැම්බර් 30 දිනැති අංක 353, 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 හා 2003 ජනවාරි 03 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ සහ මුදල් රෙගුලාසි 771 ප්‍රකාරව නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කර ඇත. |
| | (ii) 2016 දෙසැම්බර් 23 දින ගබඩාවට භාර ගෙන තිබූ රු.12,995,000 ක් වටිනා බර ඉසිලීමේ ඉලෙක්ට්‍රොනික් විනිශ්චය සංඥා පද්ධති උපකරණය 2018 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | රජය සතු වත්කම් කාර්යක්ෂමතාවයකින් හා ඵලදායි ලෙස භාවිතා කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන වාර්තාවක් කැඳවූ අතර, එය පාදක කරගෙන ඉදිරියේදී අදාළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූල කටයුතු ඇරඹීමට යෝජිතය. මෙම අමතර භාණ්ඩ ලබා දෙන ලෙස අදාළ ආයතනය ලිඛිතව දැනුවත් කළද ඔවුන් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වුවද දැනටමත් මෙම භාණ්ඩ කට්ටලයෙන් කිසියම් හෝ ආකාරයක ප්‍රයෝජනයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ඉදිරි තරඟාවලින් හිදි මෙම අමතර කොටස් කුලී පදනම මත ලබා ගනිමින් මෙම භාණ්ඩ කට්ටලය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කෙරේ. |
| (ආ) | **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම** | | . |
| | 2017 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත හා ඌනතා | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ | සිදු වූ ප්‍රමාද දෝෂයන් හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් නොකළ දිස්ත්‍රික්කවලට මෙම දෙපාර්තමේන්තු නිලධාරීන් යොදවා එම කටයුතු අවසන් කරමින් |

| | |
|---|---|
| සම්බන්ධයෙන් හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 752 (4) සහ 770 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | විධිවිධාන අනුව පවති. කටයුතු කළ යුතු වීම. |

**3.5 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 මාර්ගෝපදේශයට පටහැනිව ජාතික සංචිතවල ක්‍රීඩකයින්ගේ ආහාර වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.54,625,367 ක් වැය කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි. නේවාසිකාගාරයේ කටයුතු විධිමත් කිරීම සඳහා මේ වන විට පියවර ගනිමින් පවති. මේ වන විට සියලුම ආහාර මිලදී ගැනීම් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව සිදු කරන අතර ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම රජයේ අනුබද්ධ ආයතනයක් වන **Markfed** ආයතනයෙන් සිදු කෙරේ. ආහාර සැපයීම සම්බන්ධව විධිමත් අභ්‍යන්තර පාලනයක් ඇති කර ගැනීම සඳහා නව ලේඛන පද්ධතියක් සකස් කරමින් පවති. ඉදිරියේදි මේ සඳහා පරිගණක මෘදුකාංගයක් ලබාදීමට නියමිතය. |

## 4. තිරසර සංවර්ධන

## 4.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංවර්ධිත අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව අන්තර්ජාලය හා අදාළ චක්‍රලේඛ මගින් දෙපාර්තමේන්තුව දැනුවත් වී තිබුණ ද කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා තිරසාර සංවර්ධන ඉලක්ක කරා ලඟා වීමේදී අදාළ කාර්යයන් නියාමනය කිරීම සඳහා සියලු පාර්ශවයන් නියෝජනය වන පරිදි දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක කරා ලඟා වීමේදී දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය නිසි ලෙස හඳුනාගෙන ඒ අනුව කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි. රාජකාරි කටයුතු රාශියක් සිදු කිරිම සඳහා මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරි ඇති බැවින් අදාළ දත්ත රැස් කිරිම අපහසු වී ඇත. කෙසේ වෙතත් මේ වන විට තොරතුරු තාක්ෂණය පාදක කර ගනිමින් දත්ත රැස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. |

## 5 යහපාලනය

## 5.1 ක්‍රීඩකයින් වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)භෝජනාගාරය සහ ක්‍රීඩකයින්ගේ නේවාසිකාගාරය** | | |
| **(i)** නේවාසිකාගාරයේ මුළුතැන්ගෙය සඳහා මිලදී ගනු ලබන ද්‍රව්‍ය සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක වී නොතිබුණි. මෙහිදී, | මුළුතැන්ගෙය සඳහා මිලදී ගනු ලබන භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් පිළිබඳ විධිමත් ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | පිළිගනිමි. ඉදිරියේදී ගැටළු නිරාකරණය කර ගැනීමට කටයුතු කරමින් පවතී. අවශ්‍ය කාර්ය මණ්ඩල සඳහා පවතින පුරප්පාඩු බඳවා ගැනීමටද අයදුම් පත් කැඳවා ඇත. |

| | | |
|---|---|---|
| • ද්‍රව්‍ය ඇනවුම් කිරීමේ පොත් භාවිතා නොකිරීම<br><br>• ද්‍රව්‍ය ලැබීම් සහ නිකුත් කිරීම සඳහා ලේඛනයක් භාවිතා නොකිරීම.<br><br>• සැපයුම්කරු විසින් ද්‍රව්‍ය සමග ඉන්වොයිස් පතක් නිකුත් නොකිරීම.<br>• ලැබෙන ආහාර ද්‍රව්‍ය නිසිලෙස අධීක්ෂණය නොකිරීම.<br>• ආහාර ලබා ගන්නා ක්‍රීඩකයින්ගේ නාම ලේඛනයක් නොමැති වීම.<br>යන කරුණු නිරීක්ෂණය විය. | | |
| (ii) දෙපාර්තමේන්තුවට අයත් ටොරින්ටන් ක්‍රීඩා පිටිය අසල පිහිටි හා රීඩ් මාවත අසල පිහිටි ක්‍රීඩකයින්ගේ නේවාසිකාගාර දෙකෙහි දෙපාර්තමේන්තුවේ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ සේවය කරන නිලධාරීන් 65 දෙනෙකු නවාතැන් ගෙන තිබුණි. | ක්‍රීඩකයින්ගේ නේවාසිකාගාරයේ නිලධාරීන් නවාතැන් ගැනිම හේතුවෙන් ක්‍රීඩකයින් වැඩි ප්‍රමාණයකට නවාතැන් පහසුකම් සැලසීමට ඇති හැකියාව මඟහැරී තිබුණි. | නේවාසික නිලධාරීන්ගෙන් නේවාසිකාගාර ගාස්තු ලෙස මුදලක් අය කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් වෙතින් අනුමැතිය ලබා ගෙන ඇති අතර එම ගාස්තු තීරණය කිරීම සඳහා රජයේ තක්සේරු කරුවන් වෙත යොමු කර ඇත. |

**(ආ) ක්‍රීඩා සංගම් නියාමනය**

---------------------------

| | | |
|---|---|---|
| (i) 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගයන්හි 35 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයෙන් ප්‍රදාන ලබා ගැනීම අපේක්ෂා කරනු ලබන යම් ජාතික ක්‍රීඩා සංගමයක් විසින් සකස් කරනු ලබන වාර්ෂික අයවැය ලේඛනය තුළ අදාළ ප්‍රදානයන් හා ඊට අදාළ උපයෝජනයන් අන්තර්ගතකර තිබේද යන්න විශ්ලේෂණාත්මක ඇගයීමකට ලක්කිරීමකින් තොරව 2018 වර්ෂයේදී රු. 118,528,187 ක් ක්‍රීඩා සංගම් වෙත ප්‍රදානය කර තිබුණි. | 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගයන්හි 35 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී මෙසේ මුදල් ලබා දීමේදී වඩාත් විධිමත් විශ්ලේෂණයක් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) 2017 වර්ෂයේ ක්‍රීඩා සංගම් 13 ක් විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණ අතර, එම සංගම් වෙත රු.13,322,649 ක ප්‍රදානයන් ලබාදී තිබුණි. එසේ ලබා දුන් ප්‍රදාන විධිමත් පරිදි භාවිතා කර තිබේද යන්න තහවුරු කර ගැනීමට දෙපාර්තමේන්තුව පසු විපරම් කර නොතිබුණි. | ජාතික ක්‍රීඩා සංගම් නියෝගයන්හි 35 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි. ඉදිරියේදී ඉදිරිපත් නොකරන ලද සියලු ක්‍රීඩා සංගම් සඳහා කිසිදු ප්‍රතිපාදනයක් හෝ අනුග්‍රාහයක් නොදැක්වීමට කටයුතු කරනු ලැබේ. |